# සිංහල

## 5 ශ්‍රේණිය




Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 12 පාඩම


## ‘ද’ අකුර යොදා නාම පද කිහිපයක් සම්බන්ධ කර වාක්‍ය ලියමු.

### පියවර 1

- පහත පින්තූරයේ ඉන්නේ සඳුන්. ඔහු කියන්නේ මොනවා දැයි බලමු.




- ඒ අතර සඳුන්ගේ අක්කා මෙන්න මේ පුවරුව අල්ලාගෙන ඉන්නවා. ඒකෙ තියෙන දේ ඔයත් ශබ්ද නගා කියවන්න.




සඳුන් වැකි තුනකින් කළ ප්‍රකාශ, එයාගේ අක්කා එක වැකියකින් ප්‍රකාශ කළ ආකාරය මොන තරම් අපූරු ද?

- හොඳයි ඔයාටත් පුළුවන් නම් මේ වාක්‍ය දෙක තනි වැකියක් ලෙස කියන්න.
  - ➢ ආච්චි අම්මා ගීතයක් රස විඳියි.
  - ➢ සීයා ගීතයක් රස විඳියි.
- දැන් ඔයා ප්‍රකාශ කළ වාක්‍යය ලස්සනට ලියන්න.
  - ➢ ..........................................................................................................

## පියවර 2

- දැන් අපි මේ පින්තූර වල ඉන්න අය කරන දේ හොඳින් කියවා බලමු.



නිමාලි පන්තියට යයි.



චාමර පන්තියට යයි.



මම පන්තියට යමි.

❖ දැන් ඉතින් , මේ තුන්දෙනාම එකම ක්‍රියාවක් කරන නිසා මෙන්න මෙහෙම තනි වාක්‍යයක් සේ ලියන්න පුළුවන් .

නිමාලි ද චාමර ද මම ද
පන්තියට යමු .

❖ ඔන්න දැන් ඔයාට ප්‍රශ්නයක් ඇති නේද ක්‍රියාපදය “මු” අකුරෙන් අවසන් කළේ ඇයි කියලා?

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

ඒකට හේතුව මම ඔයාලට කියල දෙන්නම්.

**ඉතින් පුතේමෙන්න මේ වෙලාවට**
**"අපි" කියලා කියන්න වෙනවා .**
**මොකද මමත් ඉන්නවනේ.ඒ නිසා ම**
**තමයි ක්‍රියා පදය "මු "අකුරෙන්**
**අවසාන කරන්නේ.**

- හොඳයි ඔයාට දැන් තේරුණා නම් මේ වැකි එකතු කරල එක වැකියක් ලියමු.

1. මල්ලී සෙල්ලම් කරයි.
   නංගී සෙල්ලම් කරයි.
   මම සෙල්ලම් කරමි.

❖ ....................................................................................................................

2. නිමල් කාටුන් චිත්‍ර අඳියි.
   මලිත් කාටුන් චිත්‍ර අඳියි .
   මම කාටූන් චිත්‍ර අඳිමි.

❖ ....................................................................................................................

3. කමල් පාසල් වැඩ කරයි.
   නිමල් පාසල් වැඩ කරයි.
   උදාරි පාසල් වැඩ කරයි.

❖ ....................................................................................................................

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

4. පවනි සතුන්ට කරුණාව දක්වයි .
   මම සතුන්ට කරුණාව දක්වමි.

❖ ...........................................................................................................................

5. නාමලී පිරිසිදු ව සිටියි.
   උදාරි පිරිසිදු ව සිටියි.

❖ ...........................................................................................................................

<u>දැනුම පොතට</u>

මාටීන් වික්‍රමසිංහ 1890 මැයි 29 වන දින ළමාහේවගේ දොන් බැස්ටියන් වික්‍රමසිංහ සහ මාගාල්ල බලපිටිය ලියනගේ තොචෝහාමි යුවලගේ එක ම පිරිමි දරුවා ලෙස ශ්‍රී ලංකාවේ කොග්ගල ග්‍රාමයේදී උපත ලැබීය. මාටීන් වික්‍රමසිංහ සිය සාහිත්‍ය ජීවිතය ආරම්භ කළේ ලීලා(1914) නවකථාව සහ සාහිත්‍ය විචාර ලිපි සංග්‍රහයක් වූ ශාස්ත්‍රීය ලේඛන (1919) යන කෘතීන් එළිදක්වමිනි. ඉන් පසු මඩොල් දූව, අපේ ගම වැනි අනගි කෘති ඔහු අතින් ලියවිණි.

(කට පාඩම් නොකරන්න. දැනුමට පමණයි.)